# ඉරත් සඳත් එක මොහොතක බුදුන් වඳිනු දුටිමි



ධර්මසිරි ගමගේ



**පො**සොන් මහට පායන සඳේ අන් දිනක පායන සඳට වඩා අමුතුම සුන්දරත්වයක් ඇත. රන්වන් රවුම් සඳෙන් සේද දිය ඇල්ලක් සේ සඳවතුර ගලා හැලේ. සංසාරේ අප විඳින්නාවූ සියළු දුක් අතවර මේ සීත දිය ඇල්ලට හිස අල්ලා මොහොතකට සැහැල්ලු කරගත හැකිය.

තවත් අතකින් මේ සඳරැස් දහර පිය ගැට පෙළක් වැන්න. ජීවිතයේ සියළු බර කන්දරාව පොදිබැඳ පසෙකින් තබා, ඒ පියගැට පෙළ දිගේ සිත නිවන ඉසව්වකට නැගිය හැකිය.

එකොළොස් ගින්නකින් කැකෑරී දැවෙන මේ මහ පොළව මත නිරුපද්‍රිතව හා ජීවමානව අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ හුස්ම ගන්නා ලොව පැරණිම වෘක්ෂය මේ උඩ මළුවේ සමාධි සුවයෙන් වැඩසිටී.

එකොළොස් ගින්නකින් කැකෑරී දැවෙන මේ මහ පොළව මත නිරුපද්‍රිතව හා ජීවමානව අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ හුස්ම ගන්නා ලොව පැරණිම වෘක්ෂය මේ උඩ මළුවේ සමාධි සුවයෙන් වැඩසිටී.

මේ තුරු සෙවනේ අමා සුවය මුලින්ම විඳුනා ලද්දේ සිද්ධාර්ථ ගෞතම නම් දාර්ශනිකයාණන් විසිනි. සසරේ සියළු බැමි බිඳ හෙළීම සඳහා ප්‍රඥාව ලබාගැන්මට මේ තුරු සෙවන එතුමන්ට චිත්ත විජානනය සැපයීය.

සිද්ධාර්ථ ගෞතමයාණන් වහන්සේ ජීවිතයේ සත්‍යාවබෝධය කරගත්තේ වනගහනය, නදීතීරය හා ගහකොළ හරහා පැමිණි දුෂ්කර චාරිකාවෙනි. අන්තිමේදී තුරු සෙවනකදී උන්වහන්සේ ඇත්ත දුටුසේක. ඒ පූජනීය ඇසතු ගසේ ශාඛාව උඩමළුවේ නිසල සුවයෙන් වැඩසිටී. මෙතැනට වඩා සිත නිවන අන් තැනක් ලොව අන් කවර තැනක දකිම්ද?

පල්ලේගම හේමරතන පොඩිහාමුදුරුවෝ අප උඩ මළුවට කැඳවති. උන්වහන්සේ පිළියෙල කරගෙන ආ නෙළුම්මල්, කිරිපිඩු පූජාවනට අප අතගස්වති. අප කොළඹින් රැගෙන ගිය අගනා සිවුරු කීපයක් බෝ සමිඳුනට පිදීමට බැතියෙන් උන්වහන්සේට බාරකළෙමු. හාත්පස සැණෙකින් රන්වන් ආලෝකයක් නිමේශයකට නැගී මැකී යයි. සමන් පිච්ච වතුරේ පෙඟුණු ඇල් පිනි සුවඳක් බොහෝ වේලාවක් අප අවට කැර-කෙමින් තිබිණ.

දැන් අප උඩ මළුවේ සිට දකින්නේ කවදා හෝ ජීවිතයේ එකම එක වතාවක් හෝ ඔබ දැකගත යුතු චමත්කාරජනක සුන්දර දර්ශනයකි.

පොසොන් පෝයට මෝදුවන හඳ ඉහළ අහසේ පායා ඇත. රන්වන් කැල්මෙන් පිපී ආ සඳ උඩමළුවේ සිට බලන විට දර්ශනය වන්නේ උඩුවියනක් සේ පැතිර ඇති බෝපත් අතරිනි. සිහින් සුළඟේ සැලෙන රන්පත් එකිනෙක ඇතිල්ලී නින්නාදයක් මතුකරයි. පිරිතෙහි දීර්ඝ යතියක නාද සංකලනයක් සිහින් ස්වරයකින් ඉන් නිකුත් වෙයි.

විශ්වයේ ඕනෑම තැනක උදා ඉරට ඉඩ දී සඳ මැකී, දුරස්වී නික්ම යෑම සිරිතයි. එහෙත් මේ පූජනීය බෝ මළුවේදී දකින විස්මිත දර්ශනය නම් සඳ නමස්කාර රැස් කෙණ්ඩියෙන් බෝ මළුව නහවද්දී සූයර්‍යයා මුල් අරුණැල්ලෙන් බෝ සමිඳු දෙපා සිපගන්නා ආකාරයයි.

ඉරත් හඳත් එක මොහොතක සිදුකරන බුද්ධ වන්දනාව ඔබට දැකිය හැක්කේ උඩමළුව නම් මේ පුණ්‍ය තීර්ථයේදී ම පමණි.

♦ **ධර්මසිරි ගමගේ**

***කුඩා අවධියේ පොසෝන් පෝයට දෙමාපිය සහෝදර හා නෑදෑයින් සමග අනුරාධපුර අටමස්ථාන වන්දනාවේ ගිය හැටි මට සිහිවෙයි.' ඒ මතකය එක්වර නැගුණේ ප්‍රතිභාපූර්ණ කවි යෙකු, ගීත රචකයෙකු, ප්‍රවීන පත්‍රකලාවේදි යෙකු හා දක්ෂ ලේඛකයෙකුව සිටි අභාවප්‍රාප්ත ධර්මසිරි ගමගේ වියතුන් කලකට පෙර සිළුමිණ පුවත්පතට ලියා තිබූ ලිපියක් කියවීමෙනි. ඔහු මනහර කාව්‍යමය බසින් විචිත්‍රව දක්වන මෙම පොසොන් ආශ්වර්‍යය ඒ පුණ්‍ය භූමිය වෙතට අපට ඇරැයුම් කරන අභිනයකැයි සිතේ. ඒ ලිපියේ කොටසක් මෙහි බහාලන්නේ ඒ අපූර්ව වින්දනයේ බිඳක් ඔබට ද දනවනු පිණිසය.***

---

1 වන පිටුවෙන්

## පොසොන් සංස්කෘතික ........

ආරක්ෂාකොට ඉදිරියට දීමේ වගකීම අපට භාර බවයි. මෙය පිළිපැදීම නිසා එම පරිසරය නොනැසී පැවතුණ අතර එම ග්‍රාමීය පරිසරය සුන්දර විය. බත බුලතින් සපිරිණ. ඒ නිසාම ගම්බද ජනතාවට වඩා හොඳ ජීවිතයක් සොයා නගරවලට පිවිසීමේ අවශ්‍යතාවද තදින් නොවීය. ආසියාවේ පවා සංවර්ධනය වන බොහෝ රටවල සිදුවනුයේ වඩා හොඳ ජීවනයක් සොයා එසේ සංක්‍රමණය වීමය. ඒ නිසාම නගර වටා මුඩුක්කු වල අහිතකර, එසේම අති පහත් කටුක ජීවන තත්වයන් යටතේ ජීවත්වන විශාල ජන සංඛ්‍යාවක් ඒ රටවල නගරවටා රොක්වී සිටිති. ඒවායේ බොහෝ ජීවන ප්‍රශ්නවලට තුඩුදී ඇත්තේ මේ සංක්‍රමණ රටාවන් බවද එදා ජනාධිපතිවරයාගේ කතාවෙන්ද පැහැදිලි කෙරිණ.

තමන්ට අවශ්‍ය සෞඛ්‍ය, අධ්‍යාපන, පණිවුඩ හුවමාරු ඇතුළු සංනිවේදන මාර්ග, බැංකු ක්‍රම ආදී සේවාවන්ද, ප්‍රවාහන හා මාර්ග පහසුකම්ද, පානීය ජලයද, විදුලි බල සැපයුමද ආදියෙන් සමන්විත යටිතල පහසුකම් ප්‍රමාණවත් ලෙස සැපයේ නම් නගරයට සංක්‍රමණයවීමට වඩා ග්‍රාමීය ජීවිතය සනීපදායී මෙන්ම ප්‍රියජනකද වෙයි. මේවා නොඅඩුව සපයමින්, එමෙන්ම දියුණු කරමින් නවීන තාක්ෂණික වර්ධනයන්ද ග්‍රාමීය මට්ටමට ගෙන ඒම මගින් රට දියුනු කරලීම සිය පාලනයේ සංවර්ධන උපක්‍රමය බව ජනාධිපතිතුමන් විසින්ම පෙන්වා දෙනු ලැබිණ.

බොහෝ අංශවලින් අප ග්‍රාමීය ජනතාව පවා සෑහෙන මට්ටමක් ලබා ඇති ආකාරය ගෙනහැර දක්වමින් අප රට දැනටමත් මානව සංවර්ධන දර්ශකයෙන් ( Human Development Index) ඉහළ මට්ටමක් ලබා ඇති ආකාරය සංඛ්‍යාලේඛනමය සාක්ෂි ඉදිරිපත් කරමින් රාජපක්ෂමහතා පැහැදිලි කළේය.

ගම වැඩුම, මග නැගුම, රන්දොර ආදී වැඩ පිළිවෙලවල් රාශියක් මගින් දැනටමත් නවීන යටිතල පහසුකම් ගමට සපයමින් විද්‍යා තාක්ෂණික දැනුම සහ කුසලතා මත ගොඩනැගෙන දැනුම පදනම් ආර්ථිකයක්



(knowledge economy) දැනට සැකසෙන ආකාරය සවිස්තරව පැහැදිලි කෙරිණ.

මේ පරිශ්‍රමයන්ට එදිරිව දැනට රටට ව්‍යසනයක්ව පවතින ත්‍රස්තවාදය මෙල්ල කිරීම අරභයා නොනවත්වා කරගෙන යන සටන ගැනද, නැගණහිර පළාතෙන් එම ත්‍රස්තවාදය තුරන් කොට එහි ප්‍රජාතන්ත්‍රීය පරිසරයක් ඇතිකර පළාත්පාලන ඡන්දයක් පවත්වමින් විසිවසරකටත් වැඩි කාලයක් එම අයිතිවාසිකම් අහිමි වී සිටි එම ජනතාවට සිය අයිතිවාසිකම් සළසා ඇති ආකාරය දැක්වීය. අප අද එල්. ටී. ටී. ඊ ත්‍රස්තවාදයට එරෙහිව කරන සටන අසාර්ථක වුවහොත් එයම ත්‍රස්තවාදයට විරුද්ධව මුළු ලෝකයම කරන සටනේද පරාජයක් වන බවත් එහි ගොදුර බවට පත්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය බවත් ජනාධිපතිතුමා අවධාරණය කළේ ය.

### ලෝක ආහාර අර්බුදය සහ ගමවැඩුම

වත්මන් ආහාර අර්බුදය ලැව්ගින්නක් සේ මුළු ලොව පුරා පැතිර පවතී. ඌන සංවර්ධිත රටවලට මෙය තදින් බලපාන අතර අප රට වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට හා සංවර්ධිත රටවලට පවා මෙහි ආදීනව දැනෙන්ට පටන්ගෙන ඇත. දැන්දැන් මේ එංගලන්තයේ පවා හාල්, පිටි, පාන්, කිරි, එළවළු හා පළතුරු ආදී සියළු ආහාරයන් හි මිළ දිනෙන් දින වැඩිවෙමින් පවතී. එය ලංකාව වැනි රටවල නගරවලට තදින් බලපා ඇති අතර තරමක් හෝ ඔරොත්තු දෙන්නේ යම් ප්‍රමාණයක කෘෂි නිශ්පාදනය කෙරෙන ගම්බද ප්‍රදේශවලට පමණකි. ඉතියෝපියාව වැනි රටවලට ඉක්මණින් දුර්භික්ෂවලට පවා මුහුණ දීමට සිදුවන බවට ඊයේ පෙරේදා අනතුරු ඇඟවීම් කර තිබුණි.

දැනට මාස කීපයක පෙර සිට ලෝකයේ ඉන්ධන තෙල් මිළ ක්‍රමයෙන් වැඩිවීමට පටන්ගැනිණ. ආහාර මිළ වැඩිවීමට හේතුව මෙය යයි සමහරු කියති. තෙල් මිළ නැගීම ප්‍රධාන හේතුවක් වුව ද එය එකම හේතුව නොවේ. ගොලීය කරණය වූ වෙළඳ ආර්ථිකයක් තුළ මේ හේතූන් ඉතා ඉක්මනින් ලොව සෑම තැනකටම බලපායි. මේ පවතින තත්වයට හේතු ගණනාවක් දැක්විය හැක.

**පරිසර විපර්යාසය** : කාර්මික විප්ලවයෙන් පසු ක්‍රමයෙන් වැඩිවූ පරිසර දූෂණයේ විෂම ආදිනව දැන් දැන් තදින් දැනෙන්නට පටන්ගෙන ඇත. එහි ප්‍රථිඵලයක් වශයෙන් කාලගුණික හා දේශගුණික විපර්‍යාස හේතුවෙන් බොහෝ කෘෂි කාර්මික රටවලට තදවැසි ජලගැල්ම හා කුණාටු නිසා කෘෂි නිෂ්පාදනවලට පහර වැදී ඇත. මෙය වැඩියෙන් බලපා ඇත්තේ දුප්පත්ම රටවලටය.

**ඉන්ධන මිළ නැග්ම** : මෙය ආහාර නිෂ්පාදන වියදම තදින්ම වැඩිකොට ඇත. මහා පරිමාණයෙන් තිරිඟු සත්ව වර්ධන ආදිය කරණ ඇමරිකාව, යුරෝපය, රුසියාව, චීනය වැනි රටවල එම නිෂ්පාදන යාන්ත්‍රික කර ඇති අතර රසායනික පොහොර ආදී දේවල මිළ තදින්ම වැඩි වීය. ලංකාව වැනි රටවල කෘෂි නිෂ්පාදනය ටද මේ සාධක බලපා ඇත.

**භෝජනරටාව වෙනස්වීම** ලෝකයේ දැන් බොහෝ රටවල් වැඩියෙන් මාංශ පදනම් ආහාර වලට පුරුදුවී ඇත. ඒ සඳහා වැඩියෙන් සතුන් ඇතිකරන බැවින් සත්ව ආහාර සඳහා ධාන්‍ය යෙදීමට පටන්ගෙන තිබේ. කෘෂි නිෂ්පාදනයෙන් එන ධාන්‍ය මෙසේ වෙනතක ඇදී යනවිට දිළිඳු රටවල ජනයාගේ ආහාරයට පහර වැදී ඇත.

මේ ආදී කරුණු නිසා නුදුරු අනාගතයේ අපේ රටවල ආහාර අර්බුදය තවත් තීව්‍ර වෙනවා නිසැකය. මේ සියල්ලෙන් පෙන්නුම්කරන්නේ ලංකාව වැනි රටවල් තම ආහාර හැකි පමණ තමාම නිපදවාගනිමින් අනාගතයට මුහුණදීමේ වැදගත්කමයි. වෙන කරන්නට දෙයක් නැත. බොරු නිදහස් විවෘත ආර්ථිකයක් පැවතීම මත අප ජනතාව නැවෙන් කටට ජීවන රටාවට පුරුදු වුණු නිසා කෘෂි නිෂ්පාදනය පිරිහී විනාශවී ගියේය. මේ ලිපියෙන් අප මුල සිට පෙන්වාදුන් ගම පදනම් කරගත් කෘෂි ආර්ථිකයක් ගොඩනැගීම එයට තිබෙන එකම පිළියම වෙයි.

